# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2050/35 - 2017 දෙසැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* බල/2/1/4/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :*LD/05/2002/PC/243.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ පිළිබඳ විස්තර* :

ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 88ඒ, කන්දෙගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද ගා. 4292 හා 2017.11.14 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0017 ක් පමණ වූ මරදානවත්ත නැමති ඉඩම් කන්දෙගොඩ දෙවට පාරේ ලද්දු ශීලාගේ නිවස ළඟ සිට දුම්රිය පාර දක්වා අඩි 12 කට පාර පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

**01. කැබලි අංක 01 - මරදානවත්ත - හෙක්ටයාර් 0.0016**

*උතුරට* : එල්. ඒ. පී. කේ. ද සිල්වා හිමිකම් කියන මරදානවත්ත.
*නැගෙනහිරට* : එල්. ඒ. පී. කේ. ද සිල්වා හිමිකම් කියන මරදානවත්ත.
*දකුණට* : කන්දෙගොඩ දෙවට පාර.
*බටහිරට* : කන්දෙගොඩ දෙවට පාර.

**02. කැබලි අංක 02 - මරදානවත්ත - හෙක්ටයාර් 0.0001**

*උතුරට* : කන්දෙගොඩ දෙවට පාර.
*නැගෙනහිරට* : කන්දෙගොඩ දෙවට පාර.
*දකුණට* : ඩබ්. ජනක් වසන්ත හිමිකම් කියන මරදානවත්ත.
*බටහිරට* : ඩබ්. ජනක් වසන්ත හිමිකම් කියන මරදානවත්ත.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවය හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුම දෙනාම තම තමන්ගෙන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 මාර්තු මස 21 වැනි දින පූර්ව භාග 10.00ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 මාර්තු මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. පී. එස්. අනුරාධි,
ප්‍රාදේශීය ලේකම් ,
බලපිටිය.

2017 දෙසැම්බර් මස 16 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-163


1A - G 26836 - 17 - (2017/12)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.